# නිලාවැලියේ

අප රැගත් බෝට්ටුව මුහුදු රැල්ල කපාගෙන වේගයෙන් ඉදිරියට ඇදෙයි. මුහුදු රළට අනුව උස්පහත් වන එයට විටෙක බිඳී විසිරෙන රළ පහරද වදී. මුහුදු ලිහිණියන් රාශියක් පසුකරමින් බෝට්ටුව ඉදිරියට ඇදේ. මේ පක්ෂීන්ට තම නිජබිමේ සරණා ආගන්තුකයන් වූ අප ගැන තිගැස්මක් නැති සේය. සංචාරකයන් සහිත තවත් බෝට්ටුවක් ඈතින් ඇදෙනු පෙනේ. අප මේ සිටින්නේ ත්‍රිකුණාමලයට ආසන්න නිලාවැලි මුහුදේ ය. බියකරු යුද්ධය නිමාවීමෙන් පසු ත්‍රිකුණාමලයට සහ නිලාවැලියට පැමිණෙන සංචාරකයින් සීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇත. අප මේ ගමන් කරමින් සිටින්නේ මෑතක දී ජාතික උද්‍යානයක් බවට පත් වූ පරෙවි දූපත නැරඹීමටය.



# පරවි දූපතේ
## සුන්දරත්වය විඳගන්න

මෙම දූපත නිලාවැලි වෙරළ තීරයට දිස්වන්නේ දෙපසින් උස් කළු කුට්ටි දෙකක් සහිත බිම්කඩක් ලෙසිනි. 1974 නොවැම්බර් 01 දා අභය භූමියක් බවට ප්‍රකාශ කළ මෙය 2003 ජූනි 4 දා ජාතික උද්‍යානයක් බවට පත් කෙරිණි. ඒ එහි පාරිසරික වැදගත්කම නිසාය. මෙම වනෝද්‍යානයට පරෙවි දූපත සහ අවට කොරල් පර සහිත මුහුදු තීරය ද ඇතුළත් ය. එහි විශාලත්වය හෙක්ටයාර් 471 ක් වන අතර, උතුරු අක්ෂාංශ 8.43 සහ නැගෙනහිර දේශාංශ 81.12 අතර පිහිටා තිබේ.

අප රාත්‍රිය ගතකළ සංචාරක හෝටලයෙන් පිටත්ව හිමිදිරියේ වෙරළට ගියේ නැගෙන හිරුගේ සුන්දරත්වය දැකගනු සඳහාය. රන් පැහැ බෝලයක් ලෙසින් හිරු මුහුදෙහි ඉහළ නගී. අහස විවිධ වර්ණ රටාවලින් නැහැවී ගොසිනි. නැගෙනහිර වෙරළ තීරයට හිරු නැගීම ඉතා චමත්කාරජනකය. ඒ අතරින් නිලාවැලි සුවිශේෂ වන්නේ සුන්දර වෙරළ තීරයක සිට එම දර්ශනය දැකගත හැකි වීම නිසාය. කි.මී. 04 ක් දිගින් යුතු නිලාවැලි වෙරළ තීරය දේශීය මෙන්ම විදේශීය සංචාරකයන් අතර ද ඉතා ප්‍රකට ය. මේ නිසා වෙරළ තීරයේ සංචාරක හෝටල රැසක් බිහිවී ඇත. තැන තැන නවතා ඇත්තේ ධීවර බෝට්ටු ය. විවේකයෙන් ගත කිරීමට මෙම වෙරළ තීරය

